## වැදගත් කරුණු

- ඔප්පු ආරම්භක දිනයේ සිට වසර 2 ක් ඇතුලත කිනම් හෝ අවස්ථාවක නිත්‍ය වාරික නොගෙවන ලද විටදී, වාරික ගෙවීම සඳහා ලබා දී ඇති අනුග්‍රාහක කාල සීමාවෙන් (දින 30) පසුව එම ඔප්පුව අප්‍රාණික ඔප්පුවක් බවට පත්වේ.
- රක්ෂණ ඔප්පුව අප්‍රාණික වූ දින සිට අවු. 2ක කාල සීමාවක් තුළදී රක්ෂණ ඔප්පු හිමිකරුට ඔප්පුව නැවත ප්‍රාණවත් කළ හැක.
- පවතින වාරික මුදලේ අගය වැඩි කිරීමට පමණක් හැකියාව ඇත.
- අවම මූලික රක්ෂිත මුදල රු.100,000/-
- උපරිම මූලික රක්ෂිත මුදල = මූලික වාර්ෂික වාරිකය x ඔප්පු කාලය x 5
- ඔප්පුවේ 3 වන වසරට අදාල වාරික ගෙවීමට නොහැකි වූ විට, මූලික රක්ෂිත මුදල සහ අමතර ප්‍රතිලාභ ඇතිනම්, එම ප්‍රතිලාභ සඳහා වන මාසයට අදාළ ගාස්තු ආයෝජන ගිණුමෙන් පියවා ගැනීම මගින් රක්ෂණ ඔප්පුව ප්‍රාණවත්ව පවත්වාගෙන යන අතර, ආයෝජන ගිණුම ඒ සඳහා තවදුරටත් ප්‍රමාණවත් නොවූ විටදී රක්ෂණ ඔප්පුව අප්‍රාණික ඔප්පුවක් බවට පත් වේ.
- අමතර වාරික : අවම : රු.50,000/-, උපරිම : සීමා රහිත

ශාඛා / රක්ෂණ උපදේශක තොරතුරු :


Allianz

**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493
25-27 වන මහල, වන් ගෝල්ෆේස් කුළුණ,
අංක 1ඒ, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 02.
දුරකථන : +94 112 300 400
විද්‍යුත් තැපැල : customerservicelife@allianz.lk
වෙබ් අඩවිය : www.allianz.lk



මෙය අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් වෙතින් නිකුත් කරනු ලැබූ ජීවිත රක්ෂණ ඔප්පුවකි.


**සැලකිය යුතුයි** ______

රක්ෂණාවරණයක් මිලදී ගැනීමට පෙර රක්ෂණ ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ, බැහැර කිරීම්, නියමයන් හා කොන්දේසි පිළිබඳව හොඳින් දැනුවත් වන්න.

Allianz



# අලියාන්ස්
# ෆයිව් ප්ලස්

### සුරක්ෂිත අනාගතයක් උදෙසා
### සුවිශේෂී ආයෝජන සැලසුම

ඇලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි, පූර්ණ හිමිකාරීත්වය දරණ උප සමාගමක් වේ.

159,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70 කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 122 කට පමණ සේවය සලසයි. 2023 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස අඛණ්ඩව පස්වන වසරටත් පිදුම් ලද අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ ප්‍රමුඛතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් ෆයිව් ප්ලස්

ඔබගේ පවුලේ සාමාජිකයන්ගේ මතු අනාගතය සුරක්ෂිත කිරීම ඔබ වෙත පැවරෙන ප්‍රමුඛතම වගකීමක් වන අතරම මතු අනාගතයේ යම් ආකාරයකින් හෝ සිදුවන අනපේක්ෂිත තත්ත්වයන් වලට මුහුණදීම සහ ඒ වෙනුවෙන්, පෙර සැලසුම් සකස් කිරීම ඔබ විසින් සිදු කළ යුතුය.

ඒ නිසාම "අලියාන්ස් ෆයිව් ප්ලස්" රක්ෂණ සැලසුම ඔබ වෙනුවෙන්ම හඳුන්වාදෙන්නේ මතු අනාගතයේදී මුහුණ දීමට සිදුවන ආර්ථිකමය තත්ත්වයන්, අනපේක්ෂිත සිදුවීම් මෙන්ම ජීවිත රැකවරණයක් සහිත ආයෝජන අවස්ථාවක් ලබා දීම උදෙසාය.

මෙම ආයෝජන සැලසුම තුළ ඔබ වෙනුවෙන් ජීවිත රක්ෂණ ආවරණයක්, වාර්ෂික තරඟකාරී බැර කිරීමේ අනුපාතයක්, ලැදියා ප්‍රසාද දීමනා මෙන්ම ආයෝජන සැලසුමක්ද අන්තර්ගත වේ.

## අලියාන්ස් ෆයිව් ප්ලස් හි සුවිශේෂී ගුණාංග

- රක්ෂිත කාලය වසර 5 - 10 කි.
- රු.20,000/- ක මාසික වාරිකයකින් ඔප්පුව ආරම්භ කළ හැකි වීම.
- සුවිශේෂී ලැදියා ප්‍රසාද දීමනා.
- ඇතුලත් වීමේ උපරිම වයස අවුරුදු 70 දක්වා.
- අනපේක්ෂිත වියෝවකදී ආයෝජන ගිණුමේ වටිනාකම සහ රක්ෂිත මුදල යන ද්විත්ව ප්‍රතිලාභයන් හිමිවීම.
- කලත්‍රයාද ඔප්පුවට ඇතුලත් කර ගත හැකි වීම.
- රක්ෂිත මුදල සහ ආයෝජනය සම්බන්ධව තෝරා ගැනීමේ නම්‍යශීලී හැකියාව.
- ලැදියා ප්‍රසාද ලෙස ආයෝජන ගිණුමේ වටිනාකමින් 15% ක් ඔප්පුවේ පරිණත අගයට එකතුවීම. (අදාල වාරික දින 90ක් ඇතුලත ගෙවා තිබිය යුතුය)
- සෑම වසරක් අවසානයේම යෝජිත බැර කිරීමේ අනුපාතය ආයෝජන ගිණුමට බැර කරනු ලැබීම. අවම නිශ්චිත අනුපාතය 0%.

## රක්ෂණාවරණය සඳහා ඇතුලත් වීමේ සුදුසුකම්

- අවම වයස : අවුරුදු 18
- උපරිම වයස : අවුරුදු 70
- රක්ෂණය කල් පිරීමේ උපරිම වයස : අවුරුදු 75

## මූලික ආවරණයට අමතරව තෝරාගත හැකි අතිරේක ආවරණයන්

- හදිසි අනතුරු හේතුවෙන් සිදුවන ජීවිත අහිමි වීම් ආවරණය
- අතිරේක ජීවිත රක්ෂණ ආවරණය
- අසාධ්‍ය රෝග ආවරණය
- පූර්ණ හා සදාකාලික අකර්මන්‍යතා ආවරණය
- අර්ධ හා සදාකාලික අකර්මන්‍යතා ආවරණය
- කලත්‍රයා සඳහා ආවරණය
- ආන්තික රෝගාවරණ ප්‍රතිලාභය
- අවමංගල වියදම් ප්‍රතිලාභය

## ප්‍රතිලාභ ගෙවීම

ජීවිත අහිමි වීමකදී : රක්ෂිත අගය + හිමිකම් දිනට අදාළ ආයෝජන ගිණුමේ වටිනාකම

රක්ෂණය කල්පිරීමේදී : ආයෝජන ගිණුමේ වටිනාකම + ලැදියා ප්‍රසාද දීමනා (Loyalty Bonus), එකවර මුදලක් ලෙස ගෙවනු ලැබේ (රක්ෂණ කොන්දේසි වලට යටත්ව, ඉහත රක්ෂිත මුදල් නිත්‍ය වේ)

රක්ෂණ කාල සීමාව තුළ : අමතර ප්‍රතිලාභ (ලබාගෙන ඇති නම්)

## අවම වාරිකය

| කාල සීමාව (වසර) | වාරික ගෙවීමේ ක්‍රමය / අවම වාරිකය | | | |
|---|---|---|---|---|
| | මාසික | ත්‍රෛමාසික | අර්ධ වාර්ෂික | වාර්ෂික |
| අවු : 5 - අවු : 7 | 50,000 | 150,000 | 300,000 | 500,000 |
| අවු : 8 - අවු : 10 | 20,000 | 60,000 | 120,000 | 240,000 |

අපගේ සවිස්තරාත්මක රක්ෂණ ඔප්පු සැලැස්ම සමගින් ඔබගේ පවුලේ අනාගත ආරක්ෂාව අදම සහතික කර ගන්න. වැඩිදුර තොරතුරු දැන ගැනීමට සහ රක්ෂණාවරණයක් ලබා ගැනීමට අප අමතන්න.